මධු සඳක් උදාවී
හිම සිසිල ගලාවී
හද මඬලේ - ආදර සඳ
ඔබයි ප්‍රියාවී......

ඝන අඳුර මකාලා
මඟ හසර කියාලා
සසර සරා... පෙමින් නුරා
එනු මිහිරාවී.....//
නිල් නුවන් සලාලා - මුදු බැලුම් හෙළාලා
පෙම් පැතුම් පුරාලා - මගේ ලොවම දිනාලා

මධු සඳක්.....

පෙම් සිහින ජලාසේ
රන් නෙලුම විලාසේ
අරුණ උදේ - විහග නදේ
වෙළී තුෂාරේ.....//
හද සුවද කරාවී... යළි මිළින නොවේවී...
ඔබ මගේ දසාවී... පණ වාගේ සුරකිමී...

මධු සඳක්.....